# මහින්දාගමනය හා සිංහල සංස්කෘතියේ උදාව

*නිල්මිණි දයානන්ද*

## ප්‍රවේශය

ප්‍රාග් ඓතිහාසික යුගයේ සිරිලක පැවතියේ ගන'දුරු සමයකි. ඒ පිළිබඳ තොරතුරු මහාවංශයේ පණ්ඩුකාභය රාජ්‍ය සමයෙන් හෙළිවේ. පණ්ඩුකාභය රජු කාලවේල, චිත්තරාජ, චේතිය, මහේජ වැනි යක්ෂ යක්ෂණීන් උදෙසා වාසස්ථාන සෑදවීමෙන් මළවුන් පිදීමද, වෙස්සවණගේ වාසය සඳහා නුග ගසක්ද, ව්‍යාධදේවගේ වාසය සඳහා තල් ගසක්ද සැලසීමෙන් වෘක්ෂ වන්දනයද, නගරයේ උතුරු දිසාවේ ජෝතිය, කුම්භාණ්ඩ, ගිරි යන නිගණ්ඨ පූජකයින් සඳහා ආරාමද, සොත්ථිශාලා", "සිවිකාශාලා" නම් සිද්ධස්ථානද තැනවීමෙන් ජෛනාගමද එකල පැවති බව අනාවරණය වේ. මීට අමතරව යම, වරුණ, ස්කන්ධ, විභීෂණ වැනි හින්දු දෙවිවරුන් හා 'ව්‍යාධදේව", "කම්මාරදේව" ආදී වෘත්තීන්ට අධිපති දෙවිවරුන් ඇදහීම ආදී ඇදහිලි පන්සිය ගණනක් මෙකල පැවති බවට මහාවංශය සාක්ෂි දරයි.[1]

මෙම ප්‍රාථමික සංස්කෘතියට ස්ථාවර පදනමක් හා ප්‍රබල දර්ශනයක් සැපයුණේ ශ්‍රී බුද්ධ වර්ෂ 236 වැන්නෙහි සිදු වූ මහින්දාගමනයත් සමඟය. මිහිඳු හිමි, ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල, සුමන සාමණේර හා භණ්ඩුක උපාසක යන මෙම පිරිස් පොසොන් සඳ එළියේ මිස්සක පව්වට සම්ප්‍රාප්ත වීම සැබවින්ම ප්‍රභාමත් යුගයක අරුණැල්ලක්ම විය.

## විමර්ශනය

මිහිඳු හිමියන්ගේ පැමිණීම මෙරට බුද්ධ ශාසනයේ ආරම්භක සිද්ධිය ලෙස සලකයි. එහෙත් ඒ පිළිබඳ පරීක්ෂා කිරීමේදී මෙම සිද්ධිය ඊට මාස හතකට පමණ පෙර ඉන්දියාව හා ලංකාව අතර පැවති තානාපති සබඳතාවල ප්‍රතිඵලයක් බව කිව හැකිය. තෙවන ධර්ම සංගායනාවෙන් පසු විදේශ ධර්ම ප්‍රචාරයට ලංකාව ඇතුළත් වූයේ අශෝකගේ යම් සැලසුමක් මත විය හැක. තම පුත් මිහිඳු හිමි ලංකාවට එවීමට තීරණය කළේ අශෝක රජුගේ විශේෂ සැලකිල්ල නිසාය. මුටසීව රජු මහලු වියේ සිටි නිසා ඔහු පුත් දේවානම් පියතිස්ස කුමරු රජ වන තෙක් සිටියේද දෙරට අතර සබඳතාව නිසාය. පාටලී පුත්‍රයට ගිය අරිට්ඨ ඇමති ප්‍රමුඛ පිරිස එහි නැවතී සිටි කාලය තුළ ඔවුන්ගෙන් මෙරට භාෂාව, සිරිත් විරිත් හා ඇදහිලි ගැන මිහිඳු හිමි විමසන්නට ඇත. එමෙන්ම අරිට්ඨ ප්‍රමුඛ පිරිස පිටත් කොට මිහිඳු හිමි නැවතුණේ තම නෑයන් මුණගැසී ඒමටය. සුමන සාමණේර හා භණ්ඩුක උපාසක දූත පිරිසට තෝරාගත්තේ ඒ කාලයේදීය. පොසොන් පොහොය දින මහින්දාගමනය සිදුවූයේ මෙම සැලසුම්වල ප්‍රතිඵලයක් ලෙසය.

මිහිඳු හිමි ඇතුළු පිරිස වේදිස නුවරට පැමිණ මව හා ඥාතීන් හමු වී දින කීපයකින් මිහින්තලයට පැමිණියහ. දේවානම්පියතිස්ස රජු 40000ක් සෙනඟ පිරිවරා නැකැත් සැණකෙළියට ගියේ ධර්මදූත පිරිස පැමිණෙන බව අරිට්ඨගෙන් දැනගෙන විය හැකිය. උපසම්පන්න භික්ෂූන් පස්නමක් පිරිසට ඇතුළු කළේ මහණ කර්මය හා උපසම්පදාව ගැන කලින්ම දැන සිටි නිසාය. රජුට චුල්ල හත්ථි පදෝපම

1 එච්.ටී. බස්නායක, ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය I (ආරම්භයේ සිට පොළොන්නරු යුගයේ අවසානය දක්වා). (කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1995), 19, 20.පිටු.

සූත්‍රය දෙසීමට සිතුවේ, ඉන් ඉගැන් වෙන්නේ යමෙකු බුදුසමය වැලඳගෙන, භික්ෂුවක වී, අපිස් සිල්වත් දිවියක් ගත කොට ක්‍රමයෙන් ආධ්‍යාත්මය දියුණු කොට නිවන් ලබාගන්නා ආකාරය බැවින් විය හැකිය.

එදින සවස භණ්ඩුක උපාසක මහණ උපසම්පදා කිරීම තුළින් සංඝ සංස්ථාව හඳුන්වා දුනි. පසුව මිහිඳු හිමි විසින් ඔවුන්ට සුදුසු ධර්ම සූත්‍ර දේශනා කරන ලදී. දෙවන දින අනුලා බිසව ඇතුළු රාජකීය කාන්තාවන්ට විමාන වත්ථු හා ප්‍රේත වත්ථු කථාව දේශනා කළේ මිනිස් ලොව පින් කිරීමෙන් දෙව්ලොව සැප විඳින බවත්, පව් කිරීමෙන් ප්‍රේත ලෝකවල දුක් විඳින බවත් පෙන්වීමටය.

සාමාන්‍ය ජනතාව දේවදූත සූත්‍රය හා බාලපණ්ඩිත සූත්‍රය දේශනා කළේ මෙලොව පව් කරන අය දුක් විඳින බවත්, පින් කරන අය  සැප විඳින බවත් පෙන්වීමටයි. තුන්වන දින මහමෙව්නා උයන පූජා කිරීම හා එහි සීමා මාලක, පොකුණු, බෝධි රෝපණ ස්ථානය, සංඝාවාස, මහා ථූපය පිහිටුවන තැන් විමසීම සිදු විය. සිවුවෙනි දින ඇතුන් යෙදූ රන් නඟුලින් සීමා මාලකය ලකුණු කිරීම හා මහා විහාරය පිහිටුවන තැන් නියම කිරීම සිදු විය.

මින් අනතුරුව රජු මිහිඳු හිමිගෙන් බුදුසමය පිහිටියේදැ'යි ඇසූ විට පිහිටවූ නමුත් මුල් බැස ගැනීමක් සිදු නොවූ බව උන් වහන්සේ පැවසූහ. බුදු සමය ලක්දිව මුල් බැසගැනීම සඳහා මෙරට උපන් අයකු මහණ කළ යුතු වූයෙන් අරිට්ඨ ඇමති ප්‍රථම භික්ෂුව ලෙස මහණ උපසම්පදා කරන ලදී. පසුව බුදුන් වන්දනාව සඳහා චෛත්‍යක අවශ්‍යතාව රජු දැන්වූයෙන් සුමන සාමණේර අශෝක රජු වෙතින් ගෙන ආ බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතුව තැන්පත් කොට ථූපාරාමය ඉදි කෙරිණ.

පසුව භික්ෂුණී ශාසනය ඇති කිරීම අවශ්‍ය වූයෙන් අරිට්ඨ හිමිගේ දූත ගමන අනුව සංඝමිත් තෙරණිය වැඩම කරවන ලදී. දඹකොළ පටුනෙන් ගොඩ බට තෙරණිය ඇතුළු පිරිස බෝධි ශාඛාවට උත්සව පවත්වමින් අනුරාධපුරය දක්වා පැමිණියහ. අනුලා බිසව ඇතුළු රාජකීය කාන්තාවන් මහණ කිරීම නිසා මෙහෙණි සසුන ආරම්භ විය. මෙහෙණින් වහන්සේලා වෙනුවෙන් හත්ථාල්හක මෙහෙණවර, උපාසිකා විහාරයේ රජින විහාරය වැනි ආවාස ඉදි කෙරිණ. බෝධි ශාඛා රෝපණයෙන් පසුව මෙරට බුදු සසුන ස්ථාපිත විය.[2] මෙසේ බුදු දහම සිරිලක චිරස්ථායී කිරීමට ක්‍රමානුකූල සැලැස්මක් එකලම දියත් විය.[3]

මෙසේ ස්ථාපිත වූ බුදු දහම ශීඝ්‍රයෙන් දිවයින පුරා පැතිර යාම කෙරෙහි බලපෑ හේතු සාධක කිහිපයකි. ඉන් ප්‍රධානතම හේතුව වන්නේ රජතුමා, ඇමති මණ්ඩලය සහ ප්‍රභූ පිරිස් මුලින්ම බුදු සමය වැලඳගැනීමයි. බුදු සමය පැතිරීමට පෙර මෙරට පැවති ඇදහිලි හා විශ්වාස බුදු සසුන තරම් ප්‍රබල හෝ සංවිධානාත්මක නොවීම තවත් වැදගත් හේතුවකි. බුදු සමය හුදකලාව නොව මෞර්ය සංස්කෘතිකාංග සමඟ පැමිණීම හේතුවෙන්ද එය වේගයෙන් ජන ජීවිතයට පිවිසියේය. එසේම ජනතාවට වැඳ පුදාග ැනීම සඳහා බෞද්ධ සිද්ධස්ථාන මෙකල බිහි විය. දේවානම්පිය තිස්ස රජු විසින් ඉදි කරවන ලද ඉසුරුමුණිය, වෙස්සගිරිය, මිහින්තලය හා ථූපාරාමය ඒ අතර ප්‍රධාන  වේ. මහමෙව්නා උයනේ බෝධි රෝපණ උත්සවයට කාචරගාම (කතරගම), චන්දනගාම වැනි දුර බැහැර ප්‍රදේශවලින් සහභාගි වූ නායකයන් මඟින්ද බුදු දහම ශීඝ්‍රයෙන් සිරිලක පුරා ව්‍යාප්ත විය.[4]

අනුරාධපුර මාර්ග සන්ධි ස්ථානවල ධර්ම ශාලා තනවා තිබූ බවත්, සෑම පොහෝ දිනකම ඒවායේ ධර්ම දේශනා පැවැත්වූ බවත්, භික්ෂූන් ඇතුළු පිරිස් ධර්ම ශ්‍රවණය කළ බවත් ක්‍රි. ව. 5වන සියවසට අයත් පාහියන් වාර්තාවේ දැක්වේ. සමකාලීන යුගයේ භික්ෂූන් 60000ක් සිරිලක විසූ බවත්, අනුරාධපුර අගනුවර විසූ භික්ෂූන් 6000කට රජතුමා සිව්පසයෙන් උපස්ථාන කළ බවත්, මෙකල මහා විහාර සංඝාරාමයේ භික්ෂූන් 3000ක්ද, අභයගිරි සංඝාරාමයේ භික්ෂූන් 5000ක්ද, අභයගිරියට නැගෙනහිරින් ලී 40ක් (චීන මිනුම් ක්‍රමයකි) ඇතින් වූ කන්දක පිහිටි චෛත්‍ය නම් වූ සංඝාරාමයේ (මෙය මිහින්තලය විය හැකිය.) භික්ෂූන් 2000ක් වාසය කළ බවත් එහි වැඩි දුරටත් සඳහන් වේ.[5]

මිස්සක පව්වෙන් සමාරම්භ වී සිරිලක් ධරණී තලය සිසාරා දෝර ගලා ගිය සම්බුදු අම දහමට අනුව භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිව්වනක් පිරිසක් සමාජය තුළින් බිහි විය. එහෙයින්

2 සරත් ලයනල් , <u>සිංහල ජාතික චින්තනයේ මූලාරම්භය,</u> (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1989),54 පිට.

3 මීගොඩ පඤ්ඤාලෝක හිමි, <u>පුරාතන ශ්‍රී ලංකාව,</u> (කොළඹ: සදීපා ප්‍රකාශන මන්දිරය, 2001),70. පිට

4 එම්.සී. ද සිල්වා සහ පී.වී. කරුණාරත්න, (සංස්.), **ඉතිහාසය**, (කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1990),

5 එස්. අයි. ගමගේ, **ශ්‍රී ලංකාවේ ඉතිහාසය**. (කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ, 1995), 11 පිට.

භාරතයේ මෙන් මෙරට උග්‍ර කුල භේදයක් ඇති නොවිණ. භික්ෂුණී ශාසනය නිසා කාන්තාවන්ටද ගරුත්වයක් ලැබිණ. කෘෂිකාර්මික දිවිපෙවෙතකට අනුගත වූ ජනතාවගේ පරමාදර්ශී චරිතය වූයේ භික්ෂුන් වහන්සේය. ආර්ය අෂ්ටාංගික මාර්ගය ඔවුන්ගේ ජීවන පිළිවෙත විය. කරුණාව, මෛත්‍රීය, උපේක්ෂාව, අල්පේච්ඡතාව ආදී බෝසත් ගුණයන්ගෙන් ජන හද පූරණය විය. බුදු දහමින් ශික්ෂණය ලත් ලක් වැසියන්ගේ මෙම අහිංසකත්වය හා ආගන්තුක සත්කාරයට තිබූ ලැදියාව 'රොබට් නොක්ස්' වැනි විදේශිකයන්ගේ පවා පැසසුමට ලක් වී ඇත.

බුදු දහමේ ආභාසයෙන් ඇති වූ පුද පූජා, වත් පිළිවෙත්, උත්සව හා පෙරහැරවලින් ජන ජීවිතය ඔපවත් විය. බුදු දහමේ සුඛනම්‍ය ගුණයෙන් ප්‍රාථමික ඇදහීම්වලට නව අරුත් ගැන්විණ. මළවුන් පිදීම වෙනුවට ඔවුන් වෙනුවෙන් දන් දී පින් අනුමෝදන් කිරීමද, වෘක්ෂ වන්දනය වෙනුවට බෝධි වන්දනයද ඇරඹිණ. මිහිඳු පෙරහැර හා සංඝමිත්තා පෙරහහැර මුල් කාලයේ වූ පෙරහැර දෙවිධියක් වන අතර පසු කාලීනව ඇති වූ දළදා පෙරහැර මේ වන විට හෙළ දිව සංස්කෘතිකාංග ලොවට හඬ ගා කියන මහා සංස්කෘතික උළෙලක් බවට පත් වී හමාරය.

ග්‍රාමණී තත්ත්වයෙන් සිටි තිස්ස රජු අශෝක රජු යටතේ යළිත් අභිෂේක ලැබීමෙන් විද්‍යමාන වනුයේ, මෙරට දේශපාලන ස්ථාවරත්වය පවා ඇති වූයේ මහින්දාගමනයට සමීප සිද්ධියකින් බවයි. රාජ්‍යාගම බවට පත් වූ බුදු දහම රාජ්‍යානුග්‍රහය යටතේ ව්‍යාප්ත විය. ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ සිට ලක් සිහසුනට නීතියෙන් බලය ලැබුණේ සිංහල බෞද්ධයෙකුට පමණි. "අබෞද්ධයෙකුට රාජ්‍ය උරුමයක් නැති බව" නිශ්ශංකමල්ල රජු පොළොන්නරු බලකොටුවේ උතුරු වාසල් පුවරු ලිපියේ දක්වයි. පූජාවලී කතුවරයාද මේ අදහසම දරා ඇත. පසු කලකදී දළදාව හා පාත්‍ර ධාතුව අයත් තැනැත්තා සිරිලක රජු ලෙසින් ජනතාව අතර පිළිගැනීමක් ඇති විය.

මෙරට පාලන ප්‍රතිපත්තිය සකස් වූයේද බුදු සමයේ නොමඳ ආභාසය ලබමිණි. දසරාජ ධර්මය මෙරටට පාලන ප්‍රතිපත්තිය විය. "පොහෝ දින වෙළෙඳාම් නොකළ යුතු බවත්, එසේ කළහොත් දඩයක් අය කරගත යුතු බවත් III උදය රජුගේ බදුලු ටැම් ලිපියේ දැක්වේ. අමණ්ඩගාමිණී රජතුමා "මාඝාතය හෙවත් සතුන් නොමරත්වා!" යන ව්‍යවස්ථාව පැනවීය. භාතිකාභය රජු ගෙරි මස් කෑ අය නීච කුලවලට පත් කර ඇත. ශ්‍රී ලාංකේය රාජ්‍ය සංස්ථාව බුදු දහමින් ලත් පෝෂණය මෙමගින් පසක් වේ.

මිහිඳු හිමි විසින් අරිට්ඨ හිමි ඇතුළු මෙරට ප්‍රථම භික්ෂු පිරිසට ත්‍රිපිටක බුද්ධ භාෂිතය ද බුද්ධ කාලයේ සිට අශෝක සමයේ පැවති තෙවන ධර්ම සංගායනාව තෙක් භාරතීය මගධ පුරාවෘත්තද සිරිලක එවක පැවති මුල් භාෂාවෙන් (හෙළ භාෂාවෙන්) උගන්වන ලදී. අරිට්ඨ හිමි ඇතුළු භික්ෂු පරපුර විසින් හෙළ බසින් පැවති මෙම ත්‍රිපිටක හා පරිවාර සාහිත්‍යය මුඛ පරම්පරාවෙන් ගෙන එන ලද අතර හෙළ බසින් පැවති මෙම සාහිත්‍යය ක්‍රි.පූ. 1වන සියවසෙහි වළගම්බා රජ සමයේ මාතලේ අලු විහාරයේදී ප්‍රථම වරට ග්‍රන්ථාරූඪ කෙරිණි. එතැන් සිට දිවයිනේ ශාසනික ඉතිහාසය හා සම්බන්ධ වෘත්තාන්ත ද එකතු වෙමින් වැඩුණු මෙම සාහිත්‍යය 'හෙළටුවා' නමින් හැඳින්විණ. 5 වන සියවසේ බුද්ධඝෝෂ අටුවාචාරීන් විසින් මෙම හෙළටුවා පාලි භාෂාවට පරිවර්තනය කරන ලදී. අනුරාධපුර යුගයේ සාහිත්‍යයට පදනම් වූයේ ත්‍රිපිටකය ඇතුළු මෙම අටුවා සාහිත්‍යයයි.[6]

මහින්දාගමනයෙන් පසු සිරිලක අධ්‍යාපන කේන්ද්‍ර ස්ථානය බවට පත් වූයේ බෞද්ධ ආරාමයයි. මිහිඳු හිමි ඇරඹූ මහාවිහාරය මෙරට ප්‍රථම බෞද්ධ අධ්‍යාපන ආයතනයයි. මුලදී ත්‍රිපිටකය හැදෑරීමට සීමා වූ අධ්‍යාපන ක්‍රමය පසු කලෙක ජ්‍යොතිෂ් ශාස්ත්‍රය, වෛද්‍ය ශාස්ත්‍රය හා වාස්තු විද්‍යාව ආදී ලෞකික විෂය ක්ෂේත්‍රයන් දක්වා පුළුල් විය. සදාචාර වර්ධනයට ප්‍රමුඛත්වය ලැබිණ. විවිධ භාෂාන්තර හා සමයාන්තර ඥානයක් ලබා දුන් අතර රටේ ආර්ථික අවශ්‍යතාවන්ට අනුකූල වූ ශිල්පීය අධ්‍යාපනයක් ලබා දුන් බවටද සාක්ෂි තිබේ. මහා විහාරය, අභයගිරිය මුල් කාලීන නේවාසික විද්‍යාස්ථාන විය. තොටගමු විජයබා පිරිවෙන, පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන හා වීදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන ආදිය කෝට්ටේ යුගයේ කීර්තිධර අධ්‍යාපන කේන්ද්‍රස්ථාන විය. ත්‍රිපිටක වාගීශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වීදාගම මෛත්‍රී හිමි, වැත්තෑවේ හිමි ආදී ලෝක පූජිත විද්‍යාර්ථීන් බිහි වූයේ මෙම අධ්‍යාපනය මල්ඵල

6 එම්.සී. ද සිල්වා සහ පී.වී. කරුණාරත්න, (සංස්.), ඉතිහාසය, (කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1990), 23පිට.

ගැන්වීමෙනි. යුරෝපීයන් පැමිණ මිෂනාරි අධ්‍යාපනය ස්ථාපිත කරන තුරු මෙරට පැවතියේ මෙම බෞද්ධ අධ්‍යාපන ක්‍රමයයි.

මිහිඳු මාහිමි විසින් අශෝක රාජ්‍ය සමයේ බ්‍රාහ්මීය අක්ෂර මාලාවද මෙරටට හඳුන්වා දෙන ලදී. සිංහල හෝඩියේ හා අක්ෂර මාලාවේ විකාශනය සිදු වූයේ මෙම අක්ෂර මාලාව පදනම් කරගෙනය. වෙස්සගිරි, තෝනිගල, රිටිගල, පෙරිමියන්කුලම ආදී මුල් කාලීන ශිලා ලිපි ඊට සාක්ෂි දරයි. මෙම අක්ෂර මාලාව අනුරාධපුර අග භාගය වන විට ව්‍යක්ත අදහස් ප්‍රකාශ කළ හැකි පරිපූර්ණ අක්ෂර මාලාවක් බවට පත්ව **ධම්පියා අටුවා ගැටපදය**, **සියබස්ලකර**, **සිබවළඳ විනිස** වැනි සාහිත්‍ය ග්‍රන්ථ පවා රචනා විය. 7වන සියවසේදී දැහැමි, බැබිරි, අනුරුත් ආදී දොළොස් මහා කවීන් සිටි බව දැක්වේ. අනුරාධපුර යුගයේ සාමාන්‍ය ජනතාවගේ සාක්ෂරතාව ඉහළ මට්ටමක පැවති බවට ජීවමාන සාක්ෂියක් නම් සීගිරි කැටපත් පවුරයි. එහි සඳහන් සීගිරි ගීයක් සහ වැකියක් මෙසේය.

**"නිල් කටරොල් මලක ඇවුණු**
**වැටිකොල් මල් සෙයි.**
**සැන්දැගැ සිහි වන්නෙයි**
**මහනෙල් වනක් හය් රන්වන් හුන්"**

**"බුදල්මි, සියො වැ ආමි, සිහිගිරි බැලීමි, බැලූබැලූ බොහො ජනා ගී ලියා ලූයෙන් නො ලීමි."**[7]

පොළොන්නරු යුගයේ **බුත්සරණ**, **අමාවතුර**, **මුවදෙව්දාවත**, **සසදාවත** ආදිය ද, දඹදෙණි යුගයේ **කව්සිළුමිණ**, **සද්ධර්මරත්නාවලිය** ආදිය ද, කෝට්ටේ යුගයේ **සැළලිහිණි සංදේශය**, **කාව්‍යශේඛරය**, **ගුත්තිලය** ආදිය ද අද්විතීය ගණයේ පසු කාලීන සාහිත්‍ය නිර්මාණ වෙයි.

**"වැවයි දාගබැයි ගමයි පන්සලයි"** යන බෞද්ධ සංකල්පයෙන් පණ පෙවුණු බෝසත් ජන සමාජය තුළ කෘෂිකාර්මික දිවි පෙවතින් ලත් විවේකයත්, ආගමික නැමියාවෙන් ලත් සන්සුන්භාවයත් හේතුවෙන් ලක්වැසි ජනයා සඟමිත් තෙරණිය හා පැමිණි අටළොස් ශිල්ප ශ්‍රේණීන්ට අයත් පිරිස් විසින් (ද්‍රුමින්දාග මනයත් සමඟ) හඳුන්වා දෙන ලද සාහිත්‍ය කලා ශිල්ප කෙරෙහි වඩාත් නැඹුරු වූහ.

**"සිංහලයන් බුදු දහම වැලඳගත් පසු ගොඩනැගිලි කර්මාන්ත ආරම්භ විය. මෙය රූප නෙළීම, කැටයම්, මූර්ති හා චිත්‍ර කලාව ආදී ශිල්ප දියුණු වීමට හේතු වූයේය."**

ආචාර්ය පරණවිතාන මහතා **යුනෙස්කෝ චිත්‍ර කලා** කෘතියේ එසේ දක්වයි. ගෘහ නිර්මාණ යටතේ දාගැබ්, බෝධිඝර, වටදා ගෙවල්, සංඝාරාම, උපෝසථාඝාර ආදිය ඉදි විය. ධාන්‍යාකාර, බුබුලාකාර, පද්මාකාර, ඝණ්ඨාකාර, ඝටාකාර, ආම්ලාකාර යන විවිධ හැඩයේ දාගැබ් නිර්මාණය විය. රුවන්වැලි සෑය, ජේතවනාරාමය, කැලණිය ආදිය නිර්මාණය වූ චෛත්‍ය කිහිපයකි. රුවන්වැලි සෑය 'මහාථූපය' ලෙසද හැඳින්වූයේ එවකට සිරිලක පමණක් නොව ආසියාවේද විශාලතම දාගැබ වූ හෙයිනි. ද්‍රෝණයක් පමණ ධාතූන් තැන්පත් කර තිබීමද, එහි මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය, ධාතු නිධානෝත්සවය, කොත් පැළඳවීමේ උත්සවය හා විවෘත කිරීමේ උත්සවය ආදිය සඳහා මහා පරිමාණ ජාතික හා අන්තර් ජාතික සහභාගීත්වයක් තිබීම, අභ්‍යන්තර සැලැස්ම හා සිංහලයන්ගේ ප්‍රථම ජාතික වීරයා වූ දුටුගැමුණු රජු විසින් කරවීම ආදී කරුණු නිසා රුවන්වැලි සෑයට මෙරට දාගැබ් අතර අද්විතීය ස්ථානයක් හිමි වේ.[8]

ථූපාරාමය හා ලංකාරාමය වටදාගෙවල් සඳහා ද ලෝවාමහාපාය හා රත්නප්‍රාසාදය උපෝසථාග ාර සඳහා ද පුළුකුණාවේ ආසනඝරය ආසනඝර සඳහා ද නිශ්ශංකලතා මණ්ඩපය පළමුවන විජයබාහු, මහා පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල යන රජවරුන්ගේ මාළිගා ආදිය ආගමික නොවන ඉදිකිරීම් සඳහාද කදිම නිදසුන්ය.[9]

---

7 එම්.සී. ද සිල්වා සහ පී.වී. කරුණාරත්න, (සංස්.), **ඉතිහාසය**, (කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1990), 24පිට.

8 ආරිය ලගමුව, **අටමහා සිද්ධස්ථාන සහිත සොළොස්මහා සිද්ධස්ථාන**. (අතුරුගිරිය: අමිල ප්‍රකාශකයෝ, 2015), 10 පිට.

9 අනුරාධ සෙනෙවිරත්න, **පොළොන්නරුව මධ්‍යකාලීන ලක්දිව අගනගරය**. (කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, 2004), 130, 149 පිටු.

අශෝක ස්ථම්භවල සතර දිශා නිරූපණය කරතැයි කියන සිංහ, හස්ති, අශ්ව, වෘෂභ රූපද සාංචියේ හා අමරාවතියේ කැටයම්වල කල්පලතා හා සත්ව රූපද මෙරට කැටයම් හා මූර්තිවලට ගුරු වූයේ යැයි සිතිය හැකිය. සඳකඩපහණ, වාහල්කඩ, මුරගල්, කොරවක්ගල්, පියගැටපෙළ ආදියේ මෙම කැටයම් දක්නට ලැබේ. පසු කාලීනව මෙම කැටයම් හා මූර්ති මෙරටට ආවේණික වූ අනන්‍යතා ලක්ෂණ ඇතිව විකාශනය විය. සඳකඩපහණ එබඳු අපූරු නිර්මාණයකි. අනුරාධපුර බිසෝ මාලිගයේ සඳකඩපහණ, ශ්‍රී මහා බෝධිය, බටහිර දොරටුවේ සඳකඩපහණ, පොළොන්නරු වටදාගෙයි සඳකඩ පහණ ආදී සඳකඩපහණ කැටයම්ද, මිහින්තලේ කණ්ඨක චෛත්‍ය, අභයගිරිය, රුවන්වැලි සෑය ආදී ස්තූප ආශ්‍රිත වාහල්කඩ කැටයම්ද, ඉසුරුමුණි පෙම් යුවල, අශ්ව හිස හා මිනිසා ආදී ඉසුරුමුණි කැටයම්ද හෙළ කලාකරුවාගේ තෙළිතුඩේ හාස්කම් ගොළු බසින් පවසයි.[10]

ආචාර්ය පරණවිතානයන්ගේ අදහස අනුව මූර්ති කලාව ආරම්භ වූයේ ද ඉන්දියානු ආභාසයෙනි. සිංහල මූර්ති ශිල්පීන් විසින් වරින් වර ඉන්දියාවේ ප්‍රචලිතව පවැති ගාන්ධාර, ආන්ද්‍ර, මථුරා වැනි ප්‍රතිමා කලා සම්ප්‍රදායන්හි ආභාසය ලබා ඇත. මුල් අවධියේ කළු ගලින් බුදු පිළිම නෙළන ලද අතර කල්යත්ම මැටි, බදාම, ලී, ලෝහ, ඇත් දත්, කිරිගරුඬ ආදී මාධ්‍ය උපයෝගී කරගෙන ඇත. තොළුවිල පිළිමය, අනුරාධපුර සමාධි පිළිමය ආදිය හිඳි පිළිම සඳහාද, බුදුරුවගල පිළිමය, අවුකන පිළිමය ආදිය හිටි පිළිම සඳහාද, ගල්විහාර පිළිමය, දඹුලු විහාරයේ රන් ආලේපිත පිළිමය ආදිය සැතපෙන පිළිම සඳහාද නිදසුන්ය.[11] මේ සෑම පිළිමයකින්ම ධ්‍යාන මුද්‍රාව, අභය මුද්‍රාව, ධර්ම චක්‍ර මුද්‍රාව, භූමිස්පර්ශ මුද්‍රාව ආදී යම් මුද්‍රාවක් නිරූපණය විය. මීට අමතරව දේවතා, රජ බිසෝ බෝධි සත්ත්ව ආදීන් මූර්තිමත් කිරීමටද හෙළ කලාකරුවා ප්‍රයත්න දරා ඇත. කුෂ්ටරාජගල අවලෝකිතේශ්වර ප්‍රතිමාව, දඹේගොඩ සෙල්මුවා බෝසත් පිළිමය, වේරගල ලෝහමුවා බෝසත් පිළිමය ආදිය බෝසත් පිළිම සඳහාද රුවන්වැලි සෑ මළුවේ භාතිකාභය පිළිරුව, පොළොන්නරුවේ මහා පරාක්‍රමබාහු රජුගේ යැයි සැලකෙන ප්‍රතිමාව ආදිය රාජ ප්‍රතිමා පිළිබඳවද නිදසුන් වේ.

චිත්‍ර කලාවේ වර්ධනය ද මේත් සමගම සිදු විය. මුල් යුගයේ සිටම මෙරට චිත්‍ර කලාව පැවති බවට සාක්ෂි තිබේ. අනුරාධපුර වාහල්කඩවල තැනින් තැන චිත්‍ර තිබූ බවට සලකුණු තිබේ. සිතුල්පව්වේ හා කරඹගල ලෙන්වල මෙබඳු සටහන් අවශේෂව පවතී. රුවන්වැලි සෑයේ ඇතුළත බිත්ති සිතුවමින් අලංකෘත බව මහාවංශයේ දැක්වේ.

කාශ්‍යප රජු විසින් කරවන ලද සීගිරි සිතුවම් විශ්ව කලා අතරද අද්විතීය ස්ථානයක වැජඹෙයි. මේවා සමකාලීන අජන්තා බිතු සිතුවම්වලට බෙහෙවින් සමානත්වයක් දැක්වූවද ලාංකේය චිත්‍ර ශිල්පීන්ගේ ස්වාධීන චිත්‍ර සම්ප්‍රදායක් බව .වියත් මතයයි. මම ගුහාවෙහි ප්‍රධාන වශයෙන් චිත්‍ර 22ක් පමණ දක්නට ලැබේ. සීගිරි කතුන් පිළිබඳව විවිධ මත පළ වී ඇත. ඔවුන් සීගිරි කාශ්‍යප රජුගේ අන්තඃපුර ස්ත්‍රීන් ලෙසටත්, සේවිකාවක සමඟ මල් පූජා කිරීමට යන කුමරියක ලෙසටත් ඇතැම්හු අර්ථ දක්වති. මහාචාර්ය සෙනරත් පරණවිතාණයන්ගේ මතය වන්නේ මෙම අප්සරාවන්ගෙන් වලාකුළු හා විදුලි කෙටීම සංකේතවත් වන බවයි. එහෙත් සමස්තයක් වශයෙන් ගත් කල අප පැරණි සිත්තරුන් සුන්දර නාරි ලක්ෂණ උද්දීපනය කරමින් ඊටම උචිත ලෙස සියුමැලි මලක්, මල් පොකුරක් හෝ බඳුනක් ලබා දෙමින් සහෘදයන්ගේ සිත් ඇදගැනීම සඳහාම මේවා චිත්‍රණය කළා විය හැකිය.[12] දිඹුලාගල ලෙන්වල ඇති චිත්‍ර හා පොළොන්නරු උත්තරාරාමයේ චිත්‍ර පොළොන්නරු චිත්‍ර කලාවේ උන්නතිය විදහා පායි.

---

10 හෙන්රි ඩබ්. කේව්, **ශ්‍රී ලංකාවේ නටබුන් නගර**. (රාජගිරිය: කුරුලු පොත්, 1999), 39, 58, 70 පිටු.

11 K.M.I. Swarnasinghe, **Ancient Anuradhapura**. (Anuradhapura: Anuradhapura Maha Viharaya, 2016), 59, 66, 67,pp

12 ඩේවිඩ් අතුකෝරළ, **සීගිරිය**. (Three Line Publishers), 17, 18 පිටු.

## සමෝධානය

අවිද්‍යාවෙන් දෙනෙත් අන්ධව සසර කතරේ අතරමං වූ පුහුදුන් දනන් හද නුවණැසේ පහන්සිළු දල්වා අජරාමර නිවන් මග හෙළි කළ අසහාය මාර්ගෝපදේශකයාණෝ තිලෝගුරු සම්මා සම්බුදු රජාණෝය. එකී සම්බුදු අම දහරින් සිරිලක් ධරණී තලයම දෝවනය කරවා, සංස්කෘතික පුනරුදය තුළින් ආදීන දේශකයට මං පෙත් හෙළි කළ අසහාය මාර්ගෝපදේශකයාණෝ අනුබුදු මිහිඳු මාහිමිපාණෝය. දෙතිස් වියේදී ලක්බිමට සැපත්ව මෙරට වැඩවෙසෙමින් බුදු සසුන මෙහි ස්ථාපිත කිරීම සඳහා අනුපමේය යුග මෙහෙවරක් ඉටු කළ උන්වහන්සේ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සැබවින්ම අනුබුදුවරයෙකුම වූ සේක. උන් වහන්සේගේ ආගමනයෙන් සිංහල සංස්කෘතියේ ඇති වූ උදාව මෙසේ වචනයෙන් ගෙනහැර දැක්වීම අතිශයින් දුෂ්කරය. ඒ මහා යුග මෙහෙවර සැකෙවින් මෙසේ ගෙනහැර දක්වන ලද අතර මහින්දාගමනය හා සිංහල සංස්කෘතියේ සැම අංශයකම නව යුගයක අරුණැල්ලක් පතිත වූ බව අවිවාදාත්මකය.